# දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - බදුල්ල

# සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම - 2026

බදුල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට හා බදුල්ල දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 15 ට (මහියංගන, රිදීමාලියද්ද, මීගහකිවුල, කන්දකැටිය, සොරණාතොට, බදුල්ල, පස්සර, හාලිඇල, වැලිමඩ, ඌවපරණගම, බණ්ඩාරවෙල, ඇල්ල, හපුතලේ, හල්දුම්මුල්ල, ලුණුගල) අවශ්‍ය භාණ්ඩ හා සේවා සැපයීම සඳහා 2026 වර්ෂය වෙනුවෙන් භාණ්ඩ/සේවා සැපයුම්කරුවන් සහ ඉදිකිරීම් කටයුතු වෙනුවෙන් කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීමට **2025.11.06** දින සිට **2025.12.06** දින දක්වා අයදුම්පත් කැඳවනු ලැබේ.

**I. භාණ්ඩ සැපයීම**

1. ලිපි ද්‍රව්‍ය හා කාර්යාලයීය අවශ්‍යතා
   ඡායා පිටපත් කඩදාසි, පරිගණක මුද්‍රණ කඩදාසි, රබර් සීල්, බෝල්පොයින්ට් පෑන්, ලිපිගොනු කවර, ඇමුණුම්කටු, ලියුම් කවර, පන්චර්, ස්ටේප්ලර් ආදිය...
2. කාර්යාල උපකරණ
   මේස, පුටු, පරිගණක මේස, පරිගණක පුටු, නාම පුවරු, කාර්යාල බෑග්, ලිපිගොනු රාක්ක, අල්මාරි, කැබිනට්, වේස්, බංකු ආදිය...
3. පරිගණක සහ පරිගණක ආශ්‍රිත උපකරණ
   පරිගණක, පරිගණක මුද්‍රණ යන්ත්‍ර,පරිගණක ටෝනර් වර්ග, පරිගණක මුද්‍රණ යන්ත්‍ර තීන්ත, අනවරත බල සැපයුම (UPS), ඡායා පිටපත් යන්ත්‍ර,ෆැක්ස් යන්ත්‍ර,රෝනියෝ යන්ත්‍ර,මල්ටි මීඩියා ප්‍රොජෙක්ටර්, අනු පිටපත් යන්ත්‍ර (ඩුප්ලෝ යන්ත්‍ර) ආදිය...
4. විදුලි , විද්‍යුත් උපාංග හා නඩත්තු උපකරණ
   විදුලි පංකා, බල්බ ඇතුළු විදුලි උපාංග, ගණක යන්ත්‍ර, රූපවාහිනී යන්ත්‍ර, ගුවන්විදුලි යන්ත්‍ර, ඩිජිටල් කැමරා, වීඩියෝ කැමරා, CCTV කැමරා, වායුසමීකරණ යන්ත්‍ර, ශබ්දවාහිනී පද්ධති හා නඩත්තු උපකරණ (Tool Kit, Blower, Screwdrivers) ආදිය...
5. ව්‍යාපෘති සඳහා අවශ්‍ය උපකරණ
   වඩු උපකරණ, වෑල්ඩින් ප්ලාන්ට්, ඩ්‍රිල්, බර්නර්, ග්‍රයින්ඩර්, ධාන්‍ය පිටිකරන යන්ත්‍ර, ගම්මිරිස් සුදු කරන යන්ත්‍ර, ගම්මිරිස් කරලින් වෙන් කරන යන්ත්‍ර, ගොයම් කොළ මඩින යන්ත්‍ර, බ්ලොක් ගල් සෑදීමේ යන්ත්‍ර, අධි පීඩන ග්‍රීස් විදින යන්ත්‍ර, මල් පෝච්චි අච්චු හා ග්‍රිල් අච්චු, අධි පීඩන ජල පීඩන යන්ත්‍ර, රබර් කර්මාන්තය සඳහා අවශ්‍ය දිය රෝල් හා ඩයමන් රෝල්, මහන මැෂින්, ජූකි මැෂින්, කැටයම් ආයුධ, විදුලි තරාදි, සීලර්, ජල මෝටර් ආදිය...
6. ටයර්, ටියුබ්, වාහන බැටරි හා මෝටර් රථ අමතර කොටස්
7. නිල ඇඳුම් සඳහා රෙදි පිළි හා තිරරෙදි
8. ගොඩනැගිලි උපකරණ හා ද්‍රව්‍ය
   කළුගල්, ගඩොල්, බොරළු, යකඩ, තාර, සිමෙන්ති, වැලි, ගඩොල්, උළු, තීන්ත, විදුලි උපාංග, ක්ෂේත්‍ර පාවිච්චියට අවශ්‍ය උපකරණ, ජල ටැංකි, ජලනල උපාංග ආදිය
9. සනීපාරක්ෂක ද්‍රව්‍ය

   සබන්,විෂබීජ නාශක ද්‍රව්‍ය,වැසිකිළි සෝදන දියර, කසල බඳුන්, ඉදල්, කොසු හා පාපිසි ආදිය...

10. පොහොර හා කෘෂි රසායනික ද්‍රව්‍ය
11. ගිණි නිවන උපකරණ
12. ගොඩනැගිලි ඉදිකිරීම් සඳහා අවශ්‍යත දැව (ලී, ලෑලි )
13. මිනිස් පරිභෝජනය සඳහා සුදුසු පිසූ ආහාර /පානීය ජලය/සකස්කළ කිරි සැපයීම (කෙටි ආහාර, දිවා ආහාර, ජල බෝතල්, කිරිපැකට්, යෝගට් හා බේකරි නිෂ්පාදන ආදිය)
14. මිනිස් ආහාර සඳහා වියලි ආහාර ද්‍රව්‍ය සැපයීම (හාල්, රතු පරිප්පු, මුං ඇට, කව්පි, කඩල, සෝයා, සැමන් ටින්, වියලි හාල් මැස්සෝ, බිත්තර, කුරක්කන්, උඳු, රටකජු ආදිය)
15. පෙරදිග හා අපරදිග සංගීත භාණ්ඩ
16. ක්‍රීඩා උපකරණ හා සෙල්ලම් බඩු (ළමා උද්‍යාන හා ව්‍යායාම් උපකරණ ආදිය)
17. ලී බඩු උපකරණ (වේස්, බංකු, මේස, පුටු ආදිය)
18. කැනපි හට්, කුඩාරම් හා බුලෙෆ් සෙට්
19. හරිතාගාර උපකරණ (යූ.වී පොලිතීන්, කෘමි ප්‍රතිරෝධක දැල්)
20. කොන්ක්‍රීට් බෝක්කු බට, කොන්ක්‍රීට් කණු ආදිය
21. ස්වයං රැකියා සඳහා ඇති කරන සතුන් (කිකිළි පැටව්, කිරි ගවයින්, මාළු පැටව්, එළුවන් ආදිය)
22. රූපලාවන්‍ය උපකරණ (මේකප් සෙට්, සැලෝන් උපකරණ ආදිය)

23. ඇඟලුම් නිෂ්පාදන (පාවහන්, බෑග්, කුඩ, වැහි කබා ආදිය)
24. කෘෂිකාර්මික ව්‍යාපෘති උපකරණ (උදලු, කැති, වීල්බැරෝ, වතුර මෝටර්, මුල්ලු, අලවංගු, රේක්ක ආදිය)
25. බද්ධ කරනු ලැබූ පැළ වර්ග
ඖෂධ පැළ, රෝපණ ද්‍රව්‍ය සුළු අපනයන භෝග පැළ වර්ග, තේ පැළ, පළතුරු පැළ මල් පැළ ආදී විවිධ පැළ වර්ග හා විවිධ වර්ගයේ බීජ
26. ප්‍රතිආශ්‍රැතකරණ ජල පෙරන පද්ධතිය ස්ථාපිත කිරීම.
27. සූර්ය පැනල් සවිකිරීම.

**II.** සේවා සැපයුම්

1. ඡායා පිටපත් යන්ත්‍ර, මුද්‍රණ යන්ත්‍ර, පරිගණක හා අනු පිටපත් යන්ත්‍ර අලුත්වැඩියාව හා සේවා කිරීම
2. විදුලි උපකරණ, ශබ්දවාහිනී උපකරණ, වායු සමීකරණ යන්ත්‍ර, ජෙනරේටර්, විදුලි සෝපාන, CCTV කැමරා හා ශීතකරණ අලුත්වැඩියා කිරීම හා සේවා කිරීම,
3. ගිණි ආරක්ෂණ පද්ධතිය නඩත්තු හා සේවා කිරීම
4. විදුලි පරිපථ, ජල නල හා ජල පොම්ප අලුත්වැඩියාව
5. මෝටර් රථ සේවා කිරීම, අළුත්වැඩියා කිරීම (තහඩු වැඩ හා සින්තාරු කිරීම, වායු සමීකරණ පද්ධතිය අලුත්වැඩියා කිරීම, ආසන කුෂන් කිරීම හා කවර දැමීම, විදුලි පද්ධතිය අලුත්වැඩියා කිරීම, අමතර කොටස් සැපයීම)
6. කාර්යාල භාණ්ඩ හා උපකරණ අලුත්වැඩියාව හා ආසන කුෂන් කිරීම
7. මුද්‍රණ කටයුතු, පොත් බැඳීම, සමරු ඵලක සැදීම (ඔෆ්සෙට් මුද්‍රණ ඇතුළුව), ඡායාරූප රාමු කිරීම, කාර්යාල හැඳුනුම්පත් සකස් කිරීම හා නාමපුවරු සකස් කිරීම (ඩිජිටල් මුද්‍රණ කටයුතු), සහතික මුද්‍රණ කටයුතු, බැනර් මුද්‍රණ කටයුතු
8. පරිගණක මෘදුකාංග අලුත්වැඩියාව
9. ගස් කැපීම, බැකෝ යන්ත්‍ර සැපයීම, එක්ස්කැවේටර් යන්ත්‍ර, මාර්ග තලන, ඩෝසර් යන්ත්‍ර, මෝටර් ග්‍රේඩර් හා ටිපර් රථ ආදිය සැපයීම
10. පරිගණක ජාලගත කිරීම
11. ශබ්ද විකාශන යන්ත්‍ර සැපයීම
12. කුලී පදනම මත වාහන ලබා ගැනීම - (කාර්, වෑන්, ලොරි, බස් රථ,කැබ්රථ ආදිය)
13. පරිගණක පුහුණු ආයතන
14. රියදුරු පුහුණු ආයතන (බර වාහන, බැකෝ, එස්කැවේටර් ආදිය)
15. උත්සව අවස්ථා සඳහා භාණ්ඩ සැපයීම (පැරබෝලික් කුටි, වේදිකා, තාවකාලික ප්‍රදර්ශන කුටි, හට්, කේටරින් සර්විස්, බුෆේ සෙට්, පුටු, මේස,වායුසමීකරණ, ඩිජිටල් තිර හා බුමුතුරුණු ආදිය)
16. ආරක්ෂක සේවා
17. සනීපාරක්ෂක සේවා
18. ග්‍රිල් ගේට්ටු ඇතුළු සුදු යකඩ වැඩ සේවාවන්
19. මෘදුකාංග ( Zoom යන ආදි) සැපයීම

**III.** ඉදිකිරීම් කටයුතු

ගොඩනැගිලි, මාර්ග, පාලම්, ජල සම්පාදන හා අපජල පද්ධතිය, වාරිමාර්ග හා ජලාප්‍රවාහන ඇළ මාර්ග, කැණීම් සහ ගොඩකිරීම්
වැසි ජලය බැහැර කිරීම සහ ඉඩම් ජලාප්‍රවාහන යනාදී ඉදිකිරීම් කටයුතු හා අලුත්වැඩියා කටයුතු
(ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ ලියාපදිංචි කර ඇති ආයතන හා ලියාපදිංචි සමිති)

2. ලියාපදිංචි කිරීමේ අයදුම්පත්‍රය බදුල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල මූල්‍ය කළමනාකරණ අංශය වෙතින් හෝ බදුල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ www.badulla.dist.gov.lk යන වෙබ් අඩවියෙන් අයදුම්පත් ලබාගත හැකිය.

3. එක් එක් අයිතමයක් සඳහා ආපසු නොගෙවනු ලබන රු. 1,000.00 ක මුදලක් ගෙවා (**මුදල් ඇණවුම් හෝ චෙක්පත් භාර ගනු නොලැබේ**) නැතහොත් ලංකා බැංකු බදුල්ල ශාඛාවේ බදුල්ල දිස්ත්‍රික් ලේකම්ගේ නිළ බැංකු ගිණුම් අංකයට **7042240** බැර කර අයදුම්පත්‍රය ඉදිරිපත් කිරීමට හැකිය.

4. **2025.11.06** දින සිට **2025.12.06** දින දක්වා රාජකාරි දිනයන්වලදී උදෑසන 9.00 සිට සවස 14.00 පැය දක්වා දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල සරප් වෙත මුදල් ගෙවීමට හැකිය.

5. බැංකු මගින් මුදල් බැර කිරීමේදී තැන්පතුවේ අවශ්‍යතාවය යන කොටසේ **SR_ආයතනයේ නම සඳහන් කර මුදල් බැර කිරීම** අනිවාර්ය වේ.

6. නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය සමඟ ව්‍යාපාරයේ ලියාපදිංචි සහතිකය, VAT සඳහා ලියාපදිංචි සහතිකය හා මුදල් ගෙවීමේ කුවිතාන්සිය අමුණා **2025.12.06** දිනට හෝ ඊට ප්‍රථම ලැබෙන පරිදි පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ ගෙනවිත් බාරදිය යුතුය. ඉල්ලුම්පත් බහාලන ලියුම් කවරයේ වම් ඉහළ කෙළවරේ **" සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම - 2026"** යනුවෙන් සඳහන් කළ යුතුය.

**ප්‍රධාන ගණකාධිකාරී**<br>
**මූල්‍ය කළමනාකරණ අංශය,**<br>
**3 වන මහල,**<br>
**දිස්ත්‍රික් ලේකම් කාර්යාලය,**<br>
**බදුල්ල.**

7. කොන්ත්‍රාත් කාර්යයන් සඳහා ලියාපදිංචිවීමට අපේක්ෂා කරන්නේ නම් CIDA සහතිකයේ පිටපතක් ද අමුණා එවිය යුතුය. අදාල නොවන ලිපි ලේඛන අයදුම්පත්‍ර සමඟ ඇමිණීම නොකළ යුතු ය.

8. අයදුම්පතෙහි දක්වා ඇති ලිපිනයට පමණක් මිල ගණන් කැඳවීමේ ලිපි යැවීමට දිස්ත්‍රික් ලේකම් බැඳී සිටියි. වසර ඇතුළත ලිපිනය වෙනස් වන විට එම ලිපිනය දිස්ත්‍රික් ලේකම් වෙත දැනුම්දීමට ලියාපදිංචිකරුවන් වගබලා ගත යුතුය.

9. වැඩිදුර තොරතුරු අවශ්‍යවේ නම් දුරකථන අංක 055 222 2048 මගින් මූල්‍ය කළමනාකරණ අංශයට ඇමතීමෙන් ලබාගත හැකිය.

10. 2026 වර්ෂයට සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම සම්බන්ධව අවසන් තීරණය ගැනීමේ අයිතිය දිස්ත්‍රික් ලේකම් සතු වේ.

පණ්ඩුක ශ්‍රී ප්‍රභාත් අබේවර්ධන<br>
දිසාපති/දිස්ත්‍රික් ලේකම්<br>
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය<br>
බදුල්ල.<br>
2025.11.06

## දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, බදුල්ල
## සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීමේ අයදුම්පත්‍රය

1. ආයතනයේ නම ..........................................................................................

..........................................................................................

2. ලිපිනය ..........................................................................................

..........................................................................................

3. දුරකථන අංකය

| | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| ජංගම | | | | | | | | | | |
| ස්ථාවර | | | | | | | | | | |
| ෆැක්ස් | | | | | | | | | | |
| වට්ස්ඇප් | | | | | | | | | | |

4. විද්‍යුත් ලිපිනය ..........................................................................................

5. ලියාපදිංචි වීමට අදහස් කරන භාණ්ඩ/සේවා අංකය හා නම : (පුවත්පත් දැන්වීමේ පරිදි)

**උදා - අංකය 6 විස්තරය - වාහන අමතර කොටස්**

| භාණ්ඩ | | සේවා | |
|---|---|---|---|
| අංකය | විස්තරය | අංකය | විස්තරය |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

6. ඉදිකිරීම් ක්ෂේත්‍රයේ ලියාපදිංචිය පිළිබඳ විස්තර

| | | | |
|---|---|---|---|
| ලියාපදිංචි නම | | | |
| ICTAD ලියාපදිංචි අංකය | | ශ්‍රේණිය | |

7. වැට් ලියාපදිංචි අංකය

| | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | | | |

8. මුදල් ගෙවීම පිළිබඳ විස්තරය

**(මුදල් කුවිතාන්සිය අයදුම්පත්‍රයේ පසුපිට ඇලවීමට කටයුතු කරන්න.)**

| | | | |
|---|---|---|---|
| කුවිතාන්සි අංකය | | දිනය | |

9. ඉහත සඳහන් තොරතුරු සත්‍ය හා නිවැරදි බවත් ව්‍යාපාරය ලියාපදිංචි කිරීමේ සහතිකයේ පිටපත හා මුදල් කුවිතාන්සිය මේ සමඟ අමුණා ඇති බවත් සහතික කරමි. ඒ අනුව අප ආයතනය 2026 වර්ෂය සඳහා සැපයුම්කරුවෙකු ලෙස ලියාපදිංචි කරන ලෙස ඉල්ලා සිටිමි.

දිනය :- 2025.

..............................................

ඉල්ලුම්කරුගේ අත්සන සහ නිල මුද්‍රා